මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2020 මාර්තු

| දේශපාලන විද්‍යාව I | 12 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

උපදෙස් :-

- මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
- A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් සහ B කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්තවේ.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
- එක් පිළිතුරකට ලකුණු දෙක බැගින් 100 කි.

## A කොටස

අංක 1 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට **නිවැරදි** හෝ **වඩාත්** ගැලපෙන පිළිතුර තෝරන්න

(1) දේශපාලන විද්‍යාව

1 දාර්ශනික ලෙස අධ්‍යයනය කිරීමේ ශික්ෂණයට සීමා වේ

2 ජීවිතය නැමති තක්සලාවේ උගත් ප්‍රායෝගික ශික්ෂණයක් වේ

3 විද්‍යාත්මක අධ්‍යයනයට සීමාවන ශික්ෂණයක් වේ

4 දේශපාලන සංසිද්ධීන් ශාස්ත්‍රීයව අධ්‍යයනය කරන සමාජීය විද්‍යා ශික්ෂණයක් වේ

5 ඓතිහාසික විකාශනය තුළ වෙනස්කම් වලට භාජනය නොවූ ශික්ෂණයක් වේ (.....)

(2) දේශපාලනය යනු

1 ආණ්ඩුකරණයට සම්බන්ධ රාජ්‍ය කේන්ද්‍රීය විෂයක්වේ

2 බල තරඟය හා බැඳුනු සමජ විද්‍යා විෂයක්වේ

3 දේශපාලඥයින්ගේ වෘත්තීය කේන්ද්‍රීය විෂයක්වේ

4 වෘත්තීය දේශපාලඥයින්ගේ සහ සාමාන්‍ය පුරවැසියන්ගේ ද දේශපාලන භාවිතයක්වේ

5 රාජ්‍ය හා ආණ්ඩුවට සම්බන්ධ විෂයක් වේ (.....)

(3) ඇරිස්ටෝටල්ට අනුව ග්‍රීක නාගරික රාජ්‍ය

1 පාලකයාගේ පෞද්ගලික පරිමණ්ඩලය තුළ සිදුවන ක්‍රියාදාමයක් වේ

2 ස්ත්‍රී-පුරුෂ ද්විත්ව පරිමණ්ඩල තුළ ක්‍රියාත්මක වන පොදු භාවිතයක් වේ

3 ග්‍රීක පුරවැසි පරිමණ්ඩලයේ දේශපාලන ක්‍රියාකාරීත්වයක් වේ

4 සීමිත භූමි ප්‍රදේශයක ක්‍රියාත්මක වූ දියුණු ගෝත්‍රික අධිරාජ්‍යවාදී පාලනයක් වේ

5 දේශපාලනය සමාජ හා පෞද්ගලික පරිමණ්ඩලයන්ට අයත් ක්‍රියාදාමයක් වේ (.....)

(4) අර්ථශාස්ත්‍රීය අධ්‍යයන ක්‍රමය

1 දේශපාලනය හා ආර්ථිකය අතර පවත්නා සම්බන්ධතාවය පැහැදිලි කරයි

2 දේශපාලනය පිළිබඳ ප්‍රතිමානීය ඇගයුම් සහ විමර්ශන ඉදිරිපත් කරයි

3 දේශපාලනය අනෙකුත් සමාජ විද්‍යා අතර පවතින සම්බන්ධතාවය අධ්‍යයනය කරයි

4 දේශපාලන ප්‍රස්තුත සංසන්දනාත්මකව අධ්‍යයනය කරයි

5 දේශපාලනය සමාජ විද්‍යාව හා මානව විද්‍යාව අතර සම්බන්ධතාවය අධ්‍යයනය කරයි (.....)

(5) ආණ්ඩුව

1 සම්භාව්‍ය දේශපාලන චින්තනයේ රාජ්‍යයෙන් වෙන්ව භාවිතා වුවකි

2 රාජ්‍යයේ ප්‍රධාන ආයතනික නියෝජිතයා වේ

3 පූර්ව ප්‍රජාතන්ත්‍රවාදී යුගයේදී ජනතාව තෝරා පත් කළ සීමිත ආයතනයකි

4 පරමාධිපත්‍ය බලය හිමි රාජ්‍යයේ සේවකයා වේ

5 සමාජ දේශපාලන බලයේ කේන්ද්‍රීය ආයතනය වේ (.....)

(6) දේශපාලන පක්ෂ

1 ඓතිහාසික විමර්ශනය තුළ දීර්ඝ කාලීන ඉතිහාසයකට හිමිකම් කියයි

2 බලය ලබා ගැනීමේ අරමුණින් වියුක්තය

3 මතවාදී අනන්‍යතාවයක් පවතී

4 තනිපක්ෂ හෝ ද්විපක්ෂ යන වර්ග භේදයට වෙන් කළ නොහැකිය

5 නූතන ප්‍රජාතන්ත්‍රවාදයට අනිවාර්ය දේශපාලන ආයතන විශේෂයක් නොවේ (.....)

(7) බලපෑම් කණ්ඩායම්

1 ආණ්ඩුවට බලපෑම් කරන දේශපාලන පක්ෂ වලට සම්බන්ධ පුරවැසි කණ්ඩායම් වේ

2 ග්‍රීක යුගයේ පුරවැසි සභා නමින් හැඳින්විය

3 ආණ්ඩුවේ ප්‍රතිපත්ති පිළිබඳ අවබෝධයෙන් සිටින පුරවැසි යාන්ත්‍රණය වේ

4 නිර් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක අත්‍යවශ්‍ය යාන්ත්‍රණයක් වේ

5 දේශපාලන පක්ෂ න්‍යාය පත්‍රයට වඩා පුළුල් න්‍යාය පත්‍රයක් පවතී (.....)

(8) සිවිල් සමාජය

1 රාජ්‍ය පරිමණ්ඩලයෙන් ස්වාධීනව පොදු සමාජ අරමුණු වෙනුවෙන් සංවිධානය වු අවකාශය වේ

2 ප්‍රජාතන්ත්‍රවාදයට පසමිතුරු පොදු සමාජ අවකාශය වේ

3 දේශපාලන පක්ෂවලට සම්බන්ධ සමාජ අවකාශය වේ

4 ස්වේච්ඡා සමිති සමාගම් වලින් පරිබාහිර සමාජ අවකාශය වේ

5 වෘත්තීය සමිති නියෝජන සහිත සමාජ අවකාශය වේ (.....)

(9) දේශපාලනය අධ්‍යයනය

1 විධිමත් අධ්‍යයන ක්ෂේත්‍රයට සීමා කරයි

2 සාම්ප්‍රදායික අධ්‍යයන ක්‍රම වලට පමණක් සීමා කරයි

3 නූතන විද්‍යාත්මක ප්‍රවේශයට සීමා කරයි

4 ව්‍යවහාරික ඥානය මගින් පමණක් සිදු කරයි

5 ශාස්ත්‍රීය සහ ව්‍යවහාරික යන අධ්‍යයන ක්ෂේත්‍ර දෙක මගින් සිදු කරයි (.....)

(10) රාජාණ්ඩු

1 සුජාත භාවය ජනතාවගෙන් ලැබී ඇත

2 ඒක පුද්ගල පාලන ක්‍රමයකි

3 නූතන රාජ්‍ය මාදිලියකි

4 පුරවැසි සංකල්පය පවතී

5 ග්‍රීක නාගරික රාජ්‍ය මාදිලියකි (.....)

(11) ෆැසිස්ට්වාදී රාජ්‍ය

1 සියලුම ඒකාධිපති රාජ්‍යයන් ෆැසිස්ට්වාදී රාජ්‍යයන් වේ

2 සමාජවාදයට අනන්‍යසම දේශපාලන ව්‍යාපාරයක් වේ

3 එක් පාර්ශවයකින් අන්තවාදී ජාතික ව්‍යාපාරයක් වේ

4 සමාජවාදී සහ ඌන සංවර්ධිත රටවල සම්භවය ලැබූ දේශපාලන ව්‍යාපාරයක් වේ

5 පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයට පක්ෂපාති දේශපාලන ව්‍යාපාරයක් වේ (.....)

(12) ස්ත්‍රීවාදී දේශපාලන ධාරාව පැනනැගීමට හේතු වුයේ

1 ස්ත්‍රීන් පළමු පෙළ මනුෂයයන් ලෙස පිළිගන්නා සමාජ ප්‍රබේද හා භාවිතයන් නිර්මාණයවීම

2 ඓතිහාසික සමාජය තුළ ස්ත්‍රීන් පොදු සමාජ දේශපාලන ක්ෂේත්‍රයට සම්බන්ධවීම

3 ස්ත්‍රීන් සමාජ දේශපාලන පීඩනයට හා සූරා කෑමට ලක්වීම

4 ස්ත්‍රීන් පොදු දේශපාලන පරිමණ්ඩලයට ඇතුළත් වීම

5 ස්ත්‍රීන්ට සමාන රැකියා සමාන වැටුප් යන නෛතික පිළිගැනීම (.....)

(13) ස්ත්‍රීවාදී ප්‍රවේශය

1 ස්ත්‍රීන් සමාජ දේශපාලනයට ප්‍රවිශ්ට වීමට පවතින සීමාවන් බිඳ දැමීම අපේක්ෂා කරයි

2 ග්‍රීක සමාජයේ ස්ත්‍රිය අත්විඳි අයිතීන්ට සමාන තත්වයක් අපේක්ෂා කරයි

3 ස්ත්‍රීන් සමාජයේ දෙවන පෙළ පුරවැසියන් ලෙස පිළිගැනීම අපේක්ෂා කරයි

4 පෞද්ගලක පරිමණ්ඩලයේ කාර්යයන් සඳහා ස්ත්‍රියට අවස්ථාව ලබා දීම අපේක්ෂා කරයි

5 දේශපාලනය පුරුෂ කේන්ද්‍රීය මෙවලමක් බවට පත් කිරීම අපේක්ෂා කරයි (.....)

(14) රාජ්‍ය න්‍යාය - සමාජවාදි පැතිකඩ

1 මනුෂ්‍ය ඉතිහාසයේ සෑම අවධියකම පැවතුණේය

2 ගිවිසුම් වාදයට අනුව ප්‍රකෘති යුගයේ සීමිතව පැවතුණේය

3 ඓතිහාසික විකාශනයේ දී වෙනස්කම් වලට භාජනය නොවීය

4 ග්‍රීක යුගයේ සම්භවය ලැබුවේය

5 ධනවාදි ආර්ථික සමාජ ක්‍රමයේ නිර්මාණයකි (.....)

(15) ඒකීය ආණ්ඩුක්‍රම

1 ස්වාධිපත්‍ය බලය පදනම්ව හඳුනා ගන්නා ආණ්ඩුක්‍රම අකෘතික විශේෂයකි

2 ස්වාධිපත්‍ය බලය පරිධියේ පාලන ආයතන වලට විමධ්‍යගත කළ ආණ්ඩුක්‍රම විශේෂයකි

3 මධ්‍යම ආණ්ඩුවේ කැමැත්ත අනුව ව්‍යවස්ථාව සංශෝධනය කළ නොහැක

4 අනෙකුත් ආණ්ඩුක්‍රම වලට සාපේක්ෂව සංකීර්ණ ආණ්ඩුක්‍රමයක් වේ

5 බලය විතැන් කළ ආණ්ඩුක්‍රම ආකෘතියක් වේ (.....)

(16) සංධිය ආණ්ඩුක්‍රමය

1 ප්‍රාදේශිය අනන්‍යතාවයන් නොපිළි ගනියි

2 මධ්‍යම ආණ්ඩුවේ බලයට සංරෝධකයක් නොවේ

3 ඒකීය ආණ්ඩුක්‍රම ආකෘතියට සාපේක්ෂව නම්‍ය ව්‍යවස්ථාවක් පවතී

4 දුර්වල ප්‍රාදේශිය ආණ්ඩු ව්‍යුහයක් පවති

5 භෞමික විශාලත්වය හා සංස්කෘතික විවිධත්වය පිහිටුවා ගැනීමේ සාධකයන් වේ (.....)

(17) සහසංධිය ආණ්ඩු ක්‍රමය

1 ප්‍රාන්ත ආණ්ඩුවලට මධ්‍යම ආණ්ඩුව විසින් බලය පවරා තිබේ

2 මධ්‍යම ආණ්ඩවේ බලයට අභියෝග කිරීමට තරම් බලයක් ප්‍රාන්ත සභා වලට නැත

3 ස්වාධිපති බලය වෙන් වෙන්ව භාවිතා කරන ස්වාධීන පාලන ක්‍රමයකි

4 ප්‍රාන්ත ආණ්ඩුවල බලය ශක්තිමත්ය

5 පොදු හා සංකීර්ණ බලතල ප්‍රාන්ත තලයේ ආණ්ඩු වලට පවතී (.....)

(18) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය

1 පැහැදිලිව බලතල බෙදීමක් දක්වා තිබේ

2 අගමැති හා කැබිනට් මණ්ඩලය නාමික විධායකය වේ

3 පාර්ලිමේන්තුව හා දේශපාලන විධායකය එකවර විසුරුවා හරියි

4 ආණ්ඩුව පාර්ලිමේන්තුවට සාමුහිකව වග නොකියයි

5 කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයට භාහිර පුද්ගලයින් ගෙන් තෝරා ගනියි (.....)

(19) ජනාධිපති ආණ්ඩුක්‍රමය

1 ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකය තුළින් තෝරා පත් කරයි

2 ජනාධිපතිවරයා ආණ්ඩුවේ නායකයා වේ

3 කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තු සාමාජිකයන් අතරින් පත් වේ

4 ව්‍යවස්ථාදායක විධායක අතර ශක්තිමත් බැඳීමක් පවතී

5 ව්‍යවස්ථාදායකයට ජනාධිපතිවරයා ඉවත් කළ නොහැකි වේ (.....)

(20) ගැටුම

1 සාධනීය සහ නිශේධනීය ප්‍රතිඵල ඇති කරයි

2 සමාජය වෙනස් නොකරයි

3 ඇති වන්නේ සමාජ පාර්ශව දෙකක් අතර පමණි

4 සාධනීය ගැටුම් සමාජ නවීකරණය දුර්වල කරයි

5 තෙවන පර්ශවයක ප්‍රවේශය සහමන්ත්‍රණයේදි අවශ්‍ය වේ (.....)

- අංක **21** සිට **25** තෙක් ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරෙන් **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය** ඇතුළත් වර්ණය තෝරන්න

21 බලතල වෙන් කිරීමේ උපකල්පනය

A - පුරවැසි නිදහස වෙනුවෙන් රාජ්‍ය බලය කේන්ද්‍රගත වීම වැළැක්වීම අවධාරණය කරයි

B - බලතල භාවිතා කිරීම ආණ්ඩුවේ වෙන් වෙන්ව ඇති ශාඛා මගින් කළ යුතුවේ

C - ආණ්ඩුවේ අත්තනෝමතික පාලනයට සංවරණයක් නොවේ

D - බලය බලයෙන්ම සංවරණය කළ හැකිය යන මතය තහවුරු කරයි

E - ඒකාධිකාරී පාලනයක ක්‍රියාත්මක වන සංකල්පයකි

(1) ABCD (2) ABE ( 3) ABD (4) ACD (5) BCDE (........)

22 මානව අයිතිවාසිකම්

A - සෑම මනුෂ්‍යයකුට හිමි විය යුතුය

B – විශ්වීය ය

C - බලාත්මක වන්නේ නෛතික සහතික කිරීමෙන් ය

D – ජාත්‍යන්තර එක් නීතියේ පැතිකඩකි

E - රාජ්‍යයක් ව්‍යවස්ථානුකූලව පිළිගත් අයිතිවාසිකම් ය

(1) ABCD (2) ABC (3) ABD (4) ACD (5) BCDE (........)

23 නව ලිබරල්වාදි රාජ්‍යයේ ආරම්භය

A - රාජ්‍ය සුබ සාධන වාදය බිඳ වැටීම

B – ලෝක සමාජවාදි බල කඳවුර බිඳවැටීම

C - ගෝලීය ධනේශ්වර වාදය ජාත්‍යන්තරව ව්‍යප්ත වීම

D – ජාතික රජ්‍යය දේශ සීමාවන් ශක්තිමත් වීම

E - අන්තර් ජාතික සහ බහු ජාතික වෙළඳ සමාගම් වල මුලෝපායන් ක්‍රියාත්මක වීම

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (........)

24 ජාතිකවාදය

A - ජාතික රාජ්‍යයේ අනන්‍යතාවය මත ගොඩ නැගුණු සමාජ හා දේශපාලන ව්‍යාපරයකි

B – නූතනයේ බහු වාර්ගික රටවල සුළුතර ජන වර්ගික අනන්‍යතාවයක් ඇති බව තර්ක කරයි

C - එක් රාජ්‍යයක් එක් ජාතියක් ලෙස පිළි ගැනීමේ සාමුහිකත්වය වේ

D – දේශපාලන වශයෙන් කෙතරම් බලවත් උවද එය දාර්ශනික වශයෙන් දරිද්‍රය

E - එක් ජාතියක් අනෙක් ජාතියට වඩා උත්තරීය යන ප්‍රකාශය වේ

(1) ABCD (2) ABCE (3) ABD (4) ACDE (5) BCE (........)

25 නිරාගමිකවාදය

A - රාජ්‍ය ආගමට ද ආගම රාජ්‍යයට ද බලපෑම් නොකළ යුතුය යන්නයි

B – ලිබරල්වාදීන් සහ සමාජවාදීන් ප්‍රතික්ෂේප කරයි

C - රාජ්‍යයේ ආරක්ෂක යාන්ත්‍රණයවේ

D – බහු ආගමික සමාජයක නිරාගමිකවාදය ක්‍රියාත්මක කළ නොහැකිවේ

E - ආගම පුරවැසි අයිතිවාසිකමක් ලෙස ලිබරල්වාදීන් පිළිගනියි

(1) ABCD (2) ABE (3) ADE (4) ACDE ( 5) BCDE (........)

- අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1) (2) (3) (4) සහ (5) යන වරණ වලින් කවර වරණය දැයි තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න

| අංකය | පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 26 | සංඛ්‍යාත්මකව ජනවර්ග කීපයක් සහිත සමාජයක සුළුතරවාදී ජාතිකවාදයක් ඇතිවේ | සුළුතරවාදී ජාතිකවාදය යනු තමා ජීවත්වන රාජ්‍යයේ සිය අනන්‍යතා වලට සාධාරණයක් ඉටු නොවීම මගින් ඇති වන ජාතිකවාදයයි |
| 27 | දේශපාලනයට ආගම සම්බන්ධ කර ගැනීම නිරාගමිකවාදය වේ | සෑම ආගමකටම එක සමානව සැළකීම ඉන්දියානු ජාතිකවාදි ප්‍රතිපත්තිය වේ |
| 28 | පුද්ගලයින් අතර නොපෑහෙන අරමුණු හේතු කොට ගෙන ගැටුම් ඇතිවේ | ගැටුම් මගින් ශේධනීය මෙන්ම නිශේධනීය ප්‍රතිඵල ඇතිවේ |
| 29 | පූර්ව රාජ්‍ය යුගවල රාජ්‍ය හා ආණ්ඩුව අතර වෙනසක් පැවතිණි | නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය වල රාජ්‍ය හා ආණ්ඩුව අතර වෙනසක් දක්නට නොලැබේ |
| 30 | තනි පුද්ගලයෙක් තුළ උවද ගැටුමක් ඇතිවිය හැකිය | ගැටුම් සමතනයේ අවසාන ප්‍රතිඵලය කෙටි කාලීන සාමය ගොඩ නැගීම වේ |

## B කොටස

31 දේශපාලනයේ ක්‍රියාකාරීත්වය ස්වරූප **දෙකකි** නම් කරන්න

(1) ----------------------------------------------------------------------------------------------------

(11) ----------------------------------------------------------------------------------------------------

32 දේශපාලනය ඉගෙනීමේ ක්‍රම දෙකක් පවති එම ක්‍රම දෙක නම් කරන්න

(1) ----------------------------------------------------------------------------------------------------

(11) ----------------------------------------------------------------------------------------------------

33 පහත සඳහන් අර්ථ දැක්වීම අනුව දේශපාලන පක්ෂ වර්ග කර දක්වන්න

(1) ලිබරල් ධනවාදි චින්තනයට නැඹුරු වූ පක්ෂ ________________________________________

(11) විශාල ජනරාශි පදනමක් සහිත පක්ෂ ______________________________________________

34 බලපෑම් කණ්ඩායම් ඇමෙරිකාවේ භාවිතා වන ව්‍යවහාර **දෙකකි** එය නම් කරන්න

(1) ----------------------------------------------------------------------------------------------------

(11) ----------------------------------------------------------------------------------------------------

35 සමාජවාදී චින්තනයට අනුව සමාජ විකාශනයේ පරස්පර අරමුණු සහිත සමාජ යුග **දෙකකි** එය සඳහන් කරන්න

(1) ----------------------------------------------------------------------------------------------------

(11) ----------------------------------------------------------------------------------------------------

36 ගෝලීයකරණය හමුවේ ජාතික රාජ්‍යයට සිදුවන බලපෑම පිළිබඳ න්‍යායික ප්‍රවේශ දෙකක් ගොඩ නගා ඇත එම න්‍යායික ප්‍රවේශ **දෙක** සඳහන් කරන්න

(1) ----------------------------------------------------------------------------------------------------

(11) ----------------------------------------------------------------------------------------------------

37 අර්ධ සංධිය ආණ්ඩුක්‍රමයක ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න

(1) ----------------------------------------------------------------------------------------------------

(11) ----------------------------------------------------------------------------------------------------

38 මිශ්‍ර විධායක ආණ්ඩුක්‍රමයක විධායකය හා ව්‍යවස්ථාදායකය පත් වන්නේ වෙනස් වූ මැතිවරණ දෙකක් මගිනි එම මැතිවරණ **දෙක** සඳහන් කරන්න

(1) ----------------------------------------------------------------------------------------------------

(11) ----------------------------------------------------------------------------------------------------

39 පුරවැසි සංකල්පය අනුව පහත අර්ථ දක්වන පුරවැසි සංකල්ප **දෙක** සඳහන් කරන්න

- ❖ ටී එච් මාෂල්ට අනුව රැකියාවක් නිවසක් සහනාධාරයක් ලබා ගැනීමට අයිතිය හිමි පුරවැසියා
- ❖ දේශපාලන කාර්යන් ට ඍජු ලෙස සහභාගි වන පුරවැසියා

(1) ----------------------------------------------------------------------------------------------------

(11) ----------------------------------------------------------------------------------------------------

40 සමාජ සම්මුතිවාදී උපකල්පනයට අනුව රාජ්‍ය සහිත සහ රාජ්‍ය රහිත සමාජ යුග දෙකක් ප්‍රකාශ කරයි එම ප්‍රකාශිත යුග **දෙක** සඳහන් කරන්න

(1) ----------------------------------------------------------------------------------------------------

(11) ----------------------------------------------------------------------------------------------------

41 ඒකීය රාජ්‍යයන්හි පරිපාලන බලය විමධ්‍යගත කරන ආකාර තුනකි ඉන් **දෙකක්** සඳහන් කරන්න

(1) ----------------------------------------------------------------------------------------------------

(11) ----------------------------------------------------------------------------------------------------

42 ලිබරල්වාදය හා සමූහාණ්ඩුවාදය එකිනෙකින් වෙනස් වන ලක්ෂණ දෙකක් පවතී එම ලක්ෂණ **දෙක** නම් කරන්න

(1) ----------------------------------------------------------------------------------------------------

(11) ----------------------------------------------------------------------------------------------------

43 සමාජ ප්‍රජාතන්ත්‍රවාදි මතවාදය ප්‍රධාන ආර්ථික හා දේශපාලන චින්තන ධාරා දෙකකි සම්මිශ්‍රණයකි එම චින්තන ධාරාවන් **දෙක** සඳහන් කරන්න

(1) ----------------------------------------------------------------------------------------------------

(11) ----------------------------------------------------------------------------------------------------

44 ජාතිකවාදයට ප්‍රධාන ප්‍රවේශ තුනකි ඉන් **දෙකක්** සඳහන් කරන්න

(1) ---------------------------------------------------------------------------------------------------------------

(11) -------------------------------------------------------------------------------------------------------------

45 ගැටුම් වැළැක්වීමේ ප්‍රවේශ දෙකකි එම ප්‍රවේශ **දෙක** සඳහන් කරන්න

(1) ---------------------------------------------------------------------------------------------------------------

(11) -------------------------------------------------------------------------------------------------------------

46 දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂෙත්‍රය ප්‍රධාන උප ක්ෂෙත්‍ර පහකි ඉන් **දෙකක්** සඳහන් කරන්න

(1) ---------------------------------------------------------------------------------------------------------------

(11) -------------------------------------------------------------------------------------------------------------

47 යටත් විජිත රාජ්‍ය බිහිවීමට පූර්වයෙහි පැවති රාජ්‍ය ආකෘති දෙකකි එම ආකෘති **දෙක** සඳහන් කරන්න

(1) ---------------------------------------------------------------------------------------------------------------

(11) -------------------------------------------------------------------------------------------------------------

48 ලිබරල් වාදය ඓතිහාසිකව ප්‍රබේද තුනක් ඔස්සේ විකාශනය විය ඉන් **දෙකක්** සඳහන් කරන්න

(1) ---------------------------------------------------------------------------------------------------------------

(11) -------------------------------------------------------------------------------------------------------------

49 පහත සඳහන් සංකල්ප හඳුන්වා දුන් දේශපලන චින්තකයන් **දෙදෙනා** නම් කරන්න

(1) යුක්තිය පිළිබඳ න්‍යාය ____________________________________________________________

(11) නීතියේ සාරය__________________________________________________________________________

50 පහත සඳහන් ග්‍රන්ථ රචකයන් **දෙදෙනා** නම් කරන්න

(1) ජාතින්ගේ ධනය ____________________________________________________________________

(11) කල්පිත ප්‍රජාව ___________________________________________________________________

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2020 මාර්තු

| දේශපාලන විද්‍යාව II | 12 ශ්‍රේණිය | කාලය : පැය 03 යි |
|---|---|---|

උපදෙස් :-

- අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.
- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය.
- පළමුවැනි කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද දෙවැනි කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තුන්වෙනි කොටසින් **එක්** ප්‍රශ්නයක් ද වන සේ තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

### 1 කොටස

1 දේශපාලන විද්‍යාව ශාස්ත්‍රීය අධ්‍යයනයකි පැහැදිලි කරන්න (ලකුණු 20)

2 දේශපාලන විද්‍යා විෂය උප ක්ෂේත්‍ර පහකින් සමන්විතය සාකච්ඡා කරන්න (ලකුණු 20)

3 ගෝලීයකරණය හමුවේ නූතන ජාතික රාජ්‍ය අර්බුදයට පත්ව ඇත පැහැදිලි කරන්න (ලකුණු 20)

### 11 කොටස

4 පහත සඳහන් මාතෘකා වලට අදාළව රාජ්‍ය ආකෘති දෙකක ලක්ෂණ පැහැදිලි කරන්න

(i) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදි රජ්‍ය (ii) සමාජවාදි රාජ්‍ය

(iii) ෆැසිස්ට්වාදි රාජ්‍ය (iv) යටත් විජිත රාජ්‍ය (10 x 2 = ලකුණු 20)

5 (i) රජ්‍ය හා ආණ්ඩුව අතර වෙනස්කම් පැහැදිලි කරන්න

(ii) සමාජ සම්මුතිවාදය හෝ මාක්ස්වාදය පිළිබඳව සාකච්ඡාවක් කරන්න (10 x 2 = ලකුණු 20)

6 ඒකීය සහ සංධිය ආණ්ඩුක්‍රම අතර පවතින වෙනස්කම් සාකච්ඡා කරන්න (ලකුණු 20)

7 පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ජනාධිපති ආණ්ඩුක්‍රමයට වඩා ප්‍රජාතන්ත්‍රවාදි භාවයෙන් වැඩිය
මෙම ප්‍රකාශය සංසන්දනාත්මකව ඇගයීමක් කරන්න (ලකුණු 20)

### 111 කොටස

8 පහත සඳහන් දේශපාලන මතවාද පිළිබඳව හැඳින්වීමක් කරන්න

(i) සමුහාණ්ඩු වාදය (ii) සමාජ ප්‍රජාතන්ත්‍රවාදය

(iii) ජාතික වාදය (iv) නිරාගමිකවාදය

9 ගැටුම් වර්ගීකරණ ප්‍රබේද හෝ ගැටුම් විසදීමේ ප්‍රවේශ කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 20)

10 පහත සඳහන් ඕනෑම දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න

(i) ඒක තන්ත්‍ර ආණ්ඩුක්‍රමය (ii) සහ සංධීය ආණ්ඩුක්‍රමය

(iii) ග්‍රීක නාගරික රාජ්‍ය (iv) බලපෑම් කණ්ඩායම් වර්ග (v) සත්‍රී වාදය (10x2= ලකුණු 20)

# මතුගම අධ්‍යාපන කලාපය

අ.පො.ස. (උ.පෙළ) වාර විභාගය                    නව නිර්දේශය    2020

විෂය අංකය                    දේශපාලන විද්‍යාව

ලකුණු දීමේ පටිපාටිය    1 පත්‍රය 1,   A කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|
| 01 | 4 | 11 | 3 | 21 | 3 |
| 02 | 4 | 12 | 3 | 22 | 3 |
| 03 | 3 | 13 | 1 | 23 | 2 |
| 04 | 1 | 14 | 5 | 24 | 1 |
| 05 | 2 | 15 | 1 | 25 | 2 |
| 06 | 3 | 16 | 5 | 26 | 5 |
| 07 | 3 | 17 | 4 | 27 | 3 |
| 08 | 1 | 18 | 3 | 28 | 1 |
| 09 | 5 | 19 | 2 | 29 | 4 |
| 10 | 2 | 20 | 1 | 30 | 2 |